**ගම්පොළ නගර සභාව - 2020**
**----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**-------------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය
**-----------------------------------**

ගම්පොළ නගර සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ගම්පොළ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
**--------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළදී සභා වත්කම් 07 ක් සංවර්ධනය සඳහා වැයකර තිබූ රු.4,392,462 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරමි. | ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතු වීම. |
| (ආ) | පොදු වෙළඳපල මස්කඩ සඳහා ලේඛනය අනුව රු.3,132,240 ක හිඟයක් පවතින අතර එය රු.1,592,944 ක හිඟයක් ලෙස රු.1,539,296 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | මස් කඩ ටෙන්ඩර් මුදලින් සියයට 25 ක තැන්පතු මුදල අඩු කර දක්වා තිබීමෙන් මෙම වෙනස පවතින බව වාර්තා කරමි. | ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතු වීම. |

### 1.6.2 අසම්භාව්‍ය බැරකම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විවිධ හේතූන් මත සභාව විසින් පවරන ලද නඩු 11 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට විභාග වෙමින් පැවතුණ ද, මූල්‍ය ප්‍රකාශනවල නඩු 04 ක් සම්බන්ධයෙන් පමණක් හෙළිදරව් කර තිබුණි. | එය නිවැරදි කිරීමට කටයුතු කරමි. | ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතු වීම. |

### 1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.48,016,464 ක් වූ ගිණුම් ශේෂ 3 කට අදාළ ශේෂයන් හා උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර, රු.3,384,428 ක වෙනසක් පැවතුණි. | ජ'ර්නල් සටහන් මඟින් ගැලැපීම් කරමි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතු වීම. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති ,රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 189 හා 486 | 2004 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා පාර්ශවකරුවන් 28 කින් විවිධ ආදායම් සම්බන්ධව ලැබුණු රු.563,753 ක චෙක්පත් අගරු වී තිබුණද ඒ සම්බන්ධයෙන් 2020 දෙසැම්බර් 31 දින වන විටත් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ඒ සම්බන්ධයෙන් ගතයුතු ඉදිරි පියවර ගැනීම සඳහා නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ii) මුදල් රෙගුලාසි 571(2) | වසර 2 ක ඉක්මවූ වටිනාකම රු.1,005,827 ක් වූ තැන්පතු ශේෂ 35 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ඉකුත් තැන්පතු ආදායමට බැර කිරීමටත් කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.60,198,035 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.58,787,580 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් හා බදු | | |
| (i) | සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති රු.50,185,347 ක හිඟ ශේෂයෙන් වර්ෂය තුළදී රු.7,883,058 ක් පමණක් අය කර තිබූ අතර, එය මුළු හිඟයෙන් සියයට 16 ක අගයක් විය. | කොමිස් ගෙවීමේ පදනම මත දේපල තහනම් කිරීමේ සහයකයින් ටෙන්ඩර් කැඳවීම මඟින් බඳවාගෙන 2021 ජූනි | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂයේ රු.31,659,572 ක් බිල් කිරීම්වලින් රු.15,561,714 ක් හෙවත් මුළු බිල් කිරීම්වලින් සියයට 49 ක්අයකර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුළු වරිපනම් හිඟය රු.50,400,143 ක් විය. | මස සිට හිඟ වරිපනම් අයකර ගැනීම සඳහා යොදවා ගැනීමට කටයුතු කර ඇත. | |
| (ii) | 2020 දෙසැම්බර් 31 දින රජයේ ආයතන 14 කින් වර්ෂ 1 සිට වර්ෂ 11 දක්වා කාලයකට අදාළව රු.2,701,423 ක වරිපනම් බදු ශේෂයක් අයවිය යුතුව පැවතුණි. | රජයේ ආයතන මඟින් අයවිය යුතු හිඟ වරිපනම් බදු මුදල් අයකර ගැනීම සඳහා අදාළ ආයතන 14 වෙතම සවිස්තරාත්මක වාර්තා සහිතව ලිපි යවා ඇත. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (iii) | ගම්පොළ මලල හා ක්‍රිකට් ක්‍රීඩා සමාජයෙන් 2020 දෙසැම්බර් 31 දින වන විට මාස 21 ක් සඳහා රු.84,000 ක හිඟ බදු කුලියක් අයවිය යුතුව තිබුණි. | හිඟ මුදල් ගෙවීම පැහැර හරින අතර, සන්තකය ආපසු ලබා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (iv) | 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ රු.2,735,517 ක හිඟ බදු මුදලින් රු.883,993 ක් දසමාලෝචිත වර්ෂය සඳහා බිල්කර තිබූ රු.2,031,354 ක බදු මුදලින් රු.1,201,804 ක් පමණක් අයකරගෙන තිබූ අතර, තවදුරටත් රු.829,550 ක බදු මුදල් අයවිය යුතුව තිබුණි. | එම මුදල් අයකර ගැනීම සඳහා ලිඛිතව දැනුම් දී ඇති අතර හිඟයෙන් කොටසක් අයවී ඇත. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (v) | නගර සභාව සතු තානායම බදු දීමේදී 2019 වර්ෂයේ ජූලි සිට 2020 දෙසැම්බර් 31 දක්වා රු.2,201,020 ක මුදලක් අයවිය යුතුව පැවතුණි. | මෙම හිඟ මුදල ගෙවීමට කල් ලබාදෙන ලෙස ඉල්ලීම් කර ඇති අතර එම කාලයද අවසන් වී ඇති බැවින් සිහිකැඳවීම් යැවීමට කටයුතු කර ඇත. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | කඩ කුලී<br>------------ | | |
| (i) | පොදු වෙළඳපල කඩ කාමරවලින් රු.3,052,609 ක් ද නීතිඥ කාර්යාල සංකීර්ණයෙන් රු.299,163 ක් ද ගම්පොළ දුම්රිය මාර්ගයට ඉහළින් ඇති වෙළඳ සංකීර්ණයේ 2005 වර්ෂයේ සිට 2020 දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කුළිය රු.11,075,578 ක් ද අය කරගත යුතුව පැවතුණි. | හිඟ අයකර ගැනීම සඳහා ලිඛිතව දැනුම් දීම් සිදුකර ඇත. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ii) | ලංගම බස් නැවතුම්පොළ සාප්පු සංකීර්ණයෙන් රු.9,633,050 ක් හිඟව පැවති අතර, 2020 දෙසැම්බර් 31 දිනට සභාව සතු වෙළඳ සංකීර්ණ 07 කට අදාළව බදුකුලී රු.2,807,321 ක් සභාව වෙත අයවීමට තිබුණි. | හිඟ අයකර ගැනීම සඳහා ලිඛිතව දැනුම් දීම් සිදුකර ඇත. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වීම. |

(ඇ) වෙනත් ආදායම්

--------------------

| | | | |
|---|---|---|---|
| (i) | නගර සභා සීමාවේ ඇති දැන්වීම් පුවරු 12 කින් රු.531,450 ක් දරු.46,000 ක හිඟ ලොතරැයි කුටි බදු ආදායමක් ද දුරකථන සම්ප්‍රේෂණ කුළුණු මගින් අයවිය යුතු රු.266,223 ක් ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ii) | 2020 දෙසැම්බර් 31 දිනට රු.6,052,850 ක ත්‍රීරෝද රථ නැවතුම් ගාස්තු හිඟයෙන් ඉකුත් වර්ෂයට හා ඊට පෙර වර්ෂවලට අදාළව රු.3,961,202 ක හිඟයක් පවතින අතර, එම ආදායම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ත්‍රීරෝද රථ සමීක්ෂණයක් සිදු කරමින් පවතී. සමීක්ෂණයෙන් අනතුරුව හිඟ අය කිරීමට කටයුතු කරමි. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වීම. |

(ඈ) උසාවි දඩ හා මුද්දර ගාස්තු

--------------------------------

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් හා අනෙකුත් ආයතනවලින් ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.316,007 ක් හා මුද්දර ගාස්තු රු.19,751,000 ක් විය. | අයවිය යුතු මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කරමි. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**--------------------------------**

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

------------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුළ දෛනිකව එකතුවන කසළ ටොන් 20 ක පමණ ප්‍රමාණය කළමනාකරණය කිරීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් සකසා නොතිබීමේ හේතුවෙන් 2019 ජූලි මස සිට දිරන කසළ දඹුල්ල කසළ ව්‍යාපෘතියට ගෙනයාම සඳහා ඉන්ධන සඳහා රු.2,056,215 කද, කසළ සඳහා රු.2,076,000 කද වියදම් දරා තිබුණි. | ගම්පොළ නගර සභා බල ප්‍රදේශයේ දෛනිකව එකතුවන දිරන කසළ ටොන් 10 ක් පමණ දඹුල්ල මහ නගර සභාවේ දිගම්පතන කසළ අංගනය වෙත ගෙන යනු ලබයි. කසළ බැහැරලීම සඳහා ඉඩමක් නොමැතිවීම හේතුවෙන් දිගින් දිගටම මෙම වියදම දැරීමට සිදුවී ඇති බව දන්වා සිටිමි. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කළ යුතු වීම. |

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2016 මාර්තු 17 දිනැති අංක 2016/3 දරන මධ්‍යම පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ V ඡේදය ප්‍රකාරව කටයුතු නොකර පොදු වෙළඳපොළ එකවර මුදල් අයකර ගැනීම පිළිබඳ විශේෂ කමිටුවේදී ලබාගත් තීරණය මත සියයට 25 ක් ගෙවා ඉතිරිය සමාන වාරික 48 කින් ගෙවීමට ඉඩ සැලැසීම නිසා 2020 දෙසැම්බර් 31 දින වන විටත් රු.68,571,043 ක හිඟයක් අයකර ගැනීමට පැවතුණි. | වාරික 48 කින් අයකර ගැනීම සඳහා පැවති කමිටු නිර්දේශ ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලද පසු එක්වන් මුදල් අය කිරීමට කටයුතු කරන බව වාර්තා කරමි. | චක්‍රලේඛ ප්‍රකාරව කඩ කාමර බදු දීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | 2016 මාර්තු 17 දිනැති අංක 2016/3 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ (v)ඡේදය ප්‍රකාරව කටයුතු නොකර පොදු වෙළඳපල 152 කඩ කාමරය, ටෙන්ඩර් මුදලින් සියයට 25 ක් වන ඉතිරි මුදල වසර 5 කින් ගෙවීමට නගර සභා ලේකම්ගේ 2016 අප්‍රේල් 04 දිනැති ලිපිය මඟින් බදුකරුට අවසර ලබාදීමෙන් කඩ කාමරය බදුදී වසර 4 ක් ගතවී තිබුණද, එකවර ගෙවීමේ මුදල් රු.6,000,750 ක් මෙතෙක් අයවී නොතිබුණි. | මේ සම්බන්ධව ඉදිරි පියවර ගැනීමට ආදායම් පරීක්ෂක මහතුන් වෙත උපදෙස් ලබා දී ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර අයවිය යුතු මුදල් අයකර ගැනීම කඩිනම් කළ යුතු වීම. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 2 ක වටිනාකම රු.4,512,918 ක්වූ අතර, එයින් වසරක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂවල වටිනාකම රු.4,278,418 ක් විය. | ලැබිය යුතු ශේෂ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට යොමු කර ඇත. | නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 3 ක වටිනාකම රු.16,089,534 ක් වූ අතර, එයින් වසර 1 ක කාලයක් ඉක්මවා තිබුණු ශේෂවල වටිනාකම රු.5,287,932 ක් විය. | කර්මාන්ත ණයහිමියෝ සඳහා අරමුදල් අප ආයතනය වෙත ලැබී නොමැති බැවින් එම මුදල් ගෙවීමට නොහැකි බව වාර්තා කරමි. | නොපමාව පියවීමට කටයුතු කළ යුතු වීම. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පොදු වෙළඳපල ඉදිකිරීමට රු.2,002,742,936 ක් වැයකර තිබුණද, ටෙන්ඩර් මඟින් බදු දී තිබුණු පොදු වෙළඳපළ කඩ කාමර 100 කට අධික ප්‍රමාණයක් ව්‍යාපාරික කටයුතු කිරීමෙන් තොරව වසා | සංවරණ සීමා අවසන් වූ පසු බිල්කර එම මුදල් අය කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. ඉතිරි කඩ කාමර ටෙන්ඩර් කිරීම සඳහා කටයුතු කරමි. | සභාව සතු වත්කම් ඵලදායීව හා කාර්යක්ෂමව උපයෝජනය කරමින් අපේක්ෂිත ප්‍රතිලාභ |

| | | | |
|---|---|---|---|
| | දමා තිබූ අතර, වසා දමා ඇති කඩ කාමර විවිධ විෂමාචාර ක්‍රියාවන් සඳහා යොදාගෙන තිබුණි. කඩ කාමර 53 ක් බදු දීමට කටයුතු නොකර වසා දමා තිබුණි. | | ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | ගම්පොළ උසාවි භූමියට ප්‍රවේශ මාර්ගය ඉදිකිරීමට යෝජිත නගර සභාව සතු නිල නිවාස 4 ක් පැවති පර්චස් 30.44 ක ඉඩම 2019 දෙසැම්බර් 06 දින උඩ පළාත ප්‍රාදේශීය ලේකම් වෙත භුක්තිය භාරදී තිබුණු අතර, 2018 අප්‍රේල් 05 දිනැති අංක KD/LE/1550 දරන තක්සේරු ලිපිය අනුව එම ඉඩම රු.32,000,000 ක වටිනාකමට තක්සේරු කර තිබුණද එම මුදල් 2021 ජනවාරි 15 දින වන විටත් ලැබී නොතිබුණි. | 2021 පෙබරවාරි 19 දින පැවති ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී ද මේ පිළිබඳව සාකච්ඡා කළ බව දන්වා ඇත. | සභාවට ලැබිය යුතු මුදල් ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතු වීම. |
| (ඇ) | සභාව සතු ඉඩම් අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියෙන් තොරව අවස්ථා 03 කදී බදු දීම සිදුකර තිබුණි. | විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමි. | 1988 නගර සභා ආඥා පනතේ 36 (ඉ) II වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | සභාව සතු ඉඩම් කොටස් 114 කින් බදු ආදායම් සභාවට නොලැබෙන අතර, එම ඉඩම් සඳහා බදු ගිවිසුම් යාවත්කාලීන කරන ලද ලිපිගොනු නොතිබුණු අතර, සභාව සතු එම ඉඩම් හඳුනාගෙන තක්සේරුකර බදු ආදායම් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට සමීක්ෂණයක් මඟින් සහා දේපල හඳුනාගෙන ඇති අතර මැනීම් ආරම්භ කර ඇත. | සභාව සතු දේපල නිසි පරිදි හඳුනාගෙන බදු දී මඟින් ආදායම් ලබා ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් සකස් කළ යුතු වීම. |
| (ඉ) | වසර 05 කට වරක් කඩ කුලී තක්සේරු කළ යුතු වුවද, මෙම වෙළඳ සංකීර්ණවල කඩ කාමර 2008 වර්ෂයෙන් පසු තක්සේරු කර නොතිබුණි. | නව තක්සේරු වාර්තා ලබාගෙන ඒ අනුව බදු ගිවිසුම්වලට එළඹේ. | කඩ කුලී වසර 5 කට වරක් තක්සේරු කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඊ) | ලංගම බස් නැවතුම්පොළෙහි ඉදිකර ඇති සාප්පු සංකීර්ණයේ කඩ කාමර 42 ක් සඳහා බදුකරුවන් විසින් ඔවුනට අවශ්‍ය පරිදි වටිනාකම් තීරණය කර බදු මුදල් ගෙවමින් තිබුණි. | දිගින් දිගටම විගණන විමසුම් මඟින් පෙන්වා දුන්නද එය නිවැරදි කර ගැනීමට නොහැකි වී ඇත. මේවන විට කටයුතු යොදා ඇති බැවින් සිදුව ඇති දෝෂයන් නිවැරදි කර ගැනීම සිදු කරමි. | විධිමත් සැලැස්මක් අනුව කඩ කාමැ බදු දීමටත් කුලී අය කිරීමටත් කටයුතු කළ යුතු වීම. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,601,220 ක වටිනාකම වූ වත්කම් වර්ග 7 ක් නිෂ්ක්‍රීයව පැවතුණි. | වාහන වෙන්දේසි කිරීම සඳහා තක්සේරු වාර්තා ලබා ගැනීමට යොමුකර ඇති අතර කසළ ඇඹරුම් යන්ත්‍ර 03 සහ බ්ලොක්ගල් මැෂිම සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා කටයුතු කරමි. | වත්කම් ඵලදායීව උපයෝජනය කළ යුතු වීම. |
| (ආ) | මහල් 3 කින් යුත් පොදු වෙළඳපළ ගොඩනැගිල්ලක් ඉදිකිරීමට සැලැසුම් කර රු.2,000,000,000 ක් වැයකර මහල් 2 ක් ඉදිකර තිබුණු අතර, සැලැසුමේ දුර්වලතා හේතුවෙන් එම මහල් දෙකද ඌන උපයෝජිතව පැවතුණි. මෙම ගොඩනැගිල්ල ඉදිකර වසර 13 ක් ගතවී තිබුණද, ඉහළ මහල ඉදිකිරීමට කටයුතු කර නොතිබුණු අතර, කොන්ක්‍රීට් කොටස් පුපුරා එම ස්ථානවලින් වැසි ජලය කාන්දු වීම් පැවතුණි. | 2021 වර්ෂයේදී ජනාධිපතිතුමාගේ සංකල්පයට අනුව ක්‍රියාත්මක වන ගම සමඟ පිළිසඳරක් වැඩසටහන යටතේ මෙම ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමට යෝජනා වී ඇති අතර ඒ සඳහා ඇස්තමේන්තු සකස් කර ඉදිරි කටයුතු සඳහා යොමු කර ඇත. | සභාව සතු වත්කම් ආරක්ෂා කර ගැනීමටත් ඒවා ඵලදායීව උපයෝජනය කිරීමටත් හැකිවන ආකාරයට සැලැසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතු වීම. |